# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2421/09 - 2025 ජනවාරි මස 29 වැනි බදාදා - 2025.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 14/2024

### 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත

4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (3) වන අනුඡේදය සමග කියවිය යුතු 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති අනුර කුමාර දිසානායක වන මා විසින්, මෙහි උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල ලැයිස්තුගත කර ඇති වගන්තිවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති බලතල, මෙම නියමය මගින් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත මෙයින් පවරා දෙනු ලැබේ.

අනුර කුමාර දිසානායක,
ජනාධිපති.

2025 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

1A - G 43614 — 05 (2025/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| | *I වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| | පවරනු ලබන බලතල | එම බලතල පවරනු ලබනුයේ යම් වගන්තියක් යටතේ ද එම වගන්තිය |
| 1. | මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සකස් කිරීම | 11 වන වගන්තියේ (2) වන උප වගන්තිය |
| 2. | එළඹෙන මුදල් වර්ෂය සඳහා සහ ඉන්පසුව එළඹෙන මුදල් වර්ෂ හතර සඳහා මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක් සකස් කිරීම | 12 වන වගන්තියේ (1) වන උප වගන්තිය |
| 3. | වාර්ෂික පදනම මත ණය තිරසරභාවය පිළිබඳ විශ්ලේෂණයක් සකස් කිරීම සහ පළ කිරීම | 13 වන වගන්තියේ (2) වන උප වගන්තිය |
| 4. | 2024 අගෝස්තු මස 8 වන දිනයේ දී හිඟ තබා ඇති වියදම් අඩුකිරීම සඳහා ගෙවා නිරවුල් කිරීමේ ක්‍රමෝපායක් හඳුන්වාදීම සහ හිඟ වියදම් එකතුවීම වැළැක්වීම සඳහා යාන්ත්‍රණය පුළුල් කිරීම | 29 වන වගන්තියේ (7) වන උප වගන්තිය |
| 5. | රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් නොවන රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ව්‍යාපෘතියක් ඇතුළු රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතියක් සඳහා වාර්ෂික අයවැය මගින් මුදල් වෙන් කිරීම් නොකරන බවට තහවුරු කිරීම | 42 වන වගන්තියේ (4) වන උප වගන්තිය |
| 6. | පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආදායම් සහ වියදම් සහ වෙනත් මූල්‍ය තොරතුරු පිළිබඳ වාර්තා ඉල්ලා සිටීම | 62 වන වගන්තියේ (2) වන උප වගන්තිය |

EOG 01 - 0297

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.